# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1404 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 30/08/2024<br>පැය 1210 | | |

## මාධ්‍ය නිවේදනය

### සීනිගම ඓතිහාසික ශ්‍රී මහා දෙවොල් දේවාල පෙරහර හේතුවෙන් කොළඹ ගාල්ල ප්‍රධාන මාර්ගයේ රථවාහන ගමනාගමනය සීමා කිරීම.

ඓතිහාසික සීනිගම ශ්‍රී මහා දෙවොල් දේවාලයේ වාර්ෂික පෙරහර 2024.08.31 වන දින සිට 2024.09.03 වන දින දක්වා ගාල්ල - කොළඹ ප්‍රධාන මාර්ගයේ පහත පරිදි වීථි සංචාරය කිරීමට නියමිතව ඇත.

**2024.08.31 වන දින දහවල් 01.00 සිට රාත්‍රී 08.00 දක්වා**

- ✓ සීනිගම දේවාලයේ සිට ගාලුපාර ඔස්සේ කොළඹ දෙසට ගමන් කර තෙල්වත්ත හන්දියෙන් දකුණු දෙසට හැරී පුරාණ තොටගමුව රණ්පත් රජමහා විහාරය දක්වා ගොස් නැවතත් එම මාර්ගය ඔස්සේ සීනිගම දේවාලය දක්වා පැමිණීමට නියමිතව ඇත.

**2024.09.01 වන දින දහවල් 01.00 සිට රාත්‍රී 08.00 දක්වා**

- ✓ සීනිගම දේවාලයේ සිට ගාලුපාර ඔස්සේ හික්කඩුව නගරය දක්වා කර හික්කඩුව බස් නැවතුම්පළ අසලින් හරවා නැවත එම මාර්ගයේම සීනිගම දේවාලය වෙත පැමිණීමට නියමිතව ඇත.

**2024.09.02 වන දින සවස 06.00 සිට අළුයම 04.00 දක්වා**

- ✓ සීනිගම දේවාලයේ සිට ගාලු පාර ඔස්සේ කොළඹ දෙසට ගමන් කර තෙල්වත්ත හන්දිය තෙක් පැමිණ ආපසු හැරී නැවත සීනිගම දේවාලය වෙත පැමිණීමට නියමිතව ඇත.

**2024.09.03 වන දින සවස 06.00 සිට අළුයම 04.00 දක්වා**

- ✓ සීනිගම දේවාලයේ සිට තොටගමුව හන්දිය දක්වා ගමන් කර නැවත සීනිගම දේවාලය වෙත පැමිණීමට නියමිතව ඇත.

ඉහත දිනයන් වල දී මාර්ගයේ රථවාහන ගමනා ගමනය සීමා කරනු ලබන අතර එම මාර්ගය භාවිතා කරන මහජනතාව සහ රියදුරන් පහත විකල්ප මාර්ගයන් භාවිතා කරන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

විකල්ප මාර්ග

- ❖ ගාල්ල දෙස සිට කොළඹ දෙසට ධාවනය කරන වාහන එක් මං තීරුවක ගමන් කරවීමට නියමිතව ඇත.

- ❖ කොළඹ දෙස සිට ගාල්ල දෙසට ගමන් ගන්නා වාහන (බර වාහන හැර) මීටියාගොඩ පොලිස් වසමේ කහව හන්දියෙන් හරවා මීටියාගොඩ, කිරලගහවෙල හන්දියෙන් වමට හරවා අලුත්වල, සරණ හන්දිය, ගෝනාපීනුවල හතර මං හන්දිය හරහා කුමාර කන්ද හන්දිය ඔස්සේ ගාලු පාරට ගමන් කර හැක.

ඉහත නිවේදනය මහජනතාවගේ සහ රියදුරන්ගේ දැන ගැනීම සඳහා ඔබ මාධ්‍ය මගින් ප්‍රචාරයක් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**